L
104
KUM

UNIVERSITY OF
28 MAR 2007
LIBRARY

# ලුඩ්විග් විට්ගන්ස්ටෙන්ගේ විශ්ලේෂී විධික්‍රමය පාදක කොටගෙන දාර්ශනික ගැටලු පිළිබඳ විග්‍රහයක්

An Analysis of Problems of Philosophy
Based on Ludwig Wittgenestein's
Analytic Methodology

ලෂිකා තුෂාරි කුමාරගේ
HD/2000/676
2001/2002

606918

## සාරාංශය

"ලුඩ්විග් විට්ගන්ස්ටෛන්ගේ විශ්ලේෂි විධික්‍රමය පාදක කොටගෙන දාර්ශනික ගැටලු පිළිබඳ විග්‍රහයක්."

දාර්ශනික ලෝකය තුළ විවිධාකාර වූ ගැටලු ඇති වන බවත් එවැන්නකට විසඳුමක් හැටියට විට්ගන්ස්ටෛන්ගේ 'විශ්ලේෂි විධික්‍රමය' කෙතරම් දුරකට උපකාර කරගත හැකි වේ දැයි යන්න, පරීක්ෂා කිරීම මෙම නිබන්ධයේ මූලික අභිප්‍රාය වේ. ඔහුගේ මූලික දාර්ශනික විග්‍රහයන්හිදී සාම්ප්‍රදායික ක්‍රම භාවිතය අවධාරණය කර ඇත. සමකාලීන දර්ශනය තුළ දී ඔහු විසින් එතෙක් සාම්ප්‍රදායික විධික්‍රමයන් ඇසුරෙන් එය ඉටු කිරීමට උත්සාහ ගත්තේය.

ඔහුගේ පළමු උත්සාහය හැටියට, භාෂාවක දක්වන කාරණය නිසි පරිදි අවබෝධ කර නොගැනීම හෙවත් භාෂාවෙන් දැක්වෙන තර්කානුකූල ස්වභාවය ඉතාමත් නිවැරදි ආකාරයෙන් තේරුම් ගැනීමේ ඇති වැදගත්කම දාර්ශනික ගැටලු සඳහා විසඳුමක් වන නිසා තමාගේ 'ඇත- දර්ශනය' තුළින් ඒ බව ඉදිරිපත් කළේය. එය 'ට්‍රැක්ටේටස් ලොජිකෝ ෆිලෝසොෆිකස්' කෘතියේ විශ්ලේෂණය කළේය. එමගින් සමකාලීන දර්ශනයේ එතෙක් පැවති මූලික අරමුණ වෙනස් කරවීමට හේතු වූ අතර භාෂාව සිද්ධි වාචක බවට සීමා කරමින්, එසේ නොවන ඒවා අර්ථ ශූන්‍ය තත්වයට පත් කළේය. මෙය වනාහි එක්තරා ආකාරයකට භාෂාවේ අන්තය සොයා ගැනීමට කරන උත්සාහයක් වැනි විය.

නමුත් කාලයක් යන විට දාර්ශනික ගැටලු සඳහා 'තාර්කික භාෂාව' (Logical Language) තුළින් පමණක් පිළිතුරු සෙවීමේ නොවැදගත් භාවය ඔහුට තේරුම් ගිය අතර

ම විවිධ ගැටලුකාරි ස්ථාන තම විග්‍රහය තුළ ඇති බවද පෙනෙන්නට විය. තමාගේ 'මැත දර්ශනය' හෙවත් **'දාර්ශනික ගවේෂණ'** කෘතියෙන් ගැටලුවක ඇරඹුම හා ඊට පිළියම් යෙදීමේ විධික්‍රමය සඳහා නවතම දාර්ශනික මෙවලම් කීපයක් ඇසුරු කර ගෙන ඇත. මෙම උපක්‍රමයන් විට්ගන්ස්ටෙන්ගේ මැත කාලීන දාර්ශනික ක්‍රමවේදයන් තුළ අන්තර්ගතය. මේ නිසා දර්ශනය ක්‍රියාකාරී එමෙන්ම ගවේෂණාත්මක ක්‍රියාකාරී කාර්යයක් බවට පත් වූ අතර අර්ථවත් සිද්ධාන්ත භාවිතය ඇරඹුනි. මේ මගින් ආචාරධර්මානුකූල, ආගමික හා සෞන්දර්යාත්මක ප්‍රකාශන අර්ථවත් ඒවා බවට පත්විය. මෙය වනාහි සමකාලීන දර්ශනය තුළ වූ ගැටලු සඳහා විසඳුම් සෙවීමේ විප්ලවීය වෙනසකි. ඇසුරෙන් විශ්ලේෂණය කළ නිසා එක් පැත්තකින් විට්ගන්ස්ටෙන්ගේ ඇත - දර්ශනයෙන් සිදු වූ සමකාලීන දර්ශනයෙහි ස්වරූපය හා අරමුණ වෙනස් කර වීම යම්තාක් දුරකට සීමා කළේය. අනෙක් පැත්තෙන් ආචාරාත්මක, ආගමික, සෞන්දර්යාත්මක කියමන් අර්ථ ශූන්‍ය වන බවට වූ පිළිගැනීම වෙනුවට නැවත වරක් අර්ථවත් බවට පත් කළේය. මෙය වනාහි සමකාලීන දර්ශනය තුළ දාර්ශනික ගැටලු සඳහා විසඳුම් සෙවීමේ විප්ලවීය වෙනසකි.

මනුෂ්‍යයාට ඇති වැදගත්ම සන්නිවේදන මාධ්‍යය වන්නේ 'භාෂාව' වන නිසා දර්ශන ලෝකයේ නොයෙකුත් ගැටලු ඇති වන්නේ එම භාෂාව නිවැරදි ආකාරයෙන් භාවිත නොකිරීමෙන් බව තේරුම් ගත යුතු වේ. මේ කරුණු මුල් කොට ගෙන, දර්ශනය පිළිබඳව උනන්දුවක් ඇති අයට ඒ ගැන අවබෝධයක් ලබා දීමට විට්ගන්ස්ටෙන් විසින් 20 වන සියවසේදී දරණ ලද බලවත් උත්සහය අවධාරණය කිරීම මාගේ නිබන්ධනයේ අරමුණ වේ.